**ව්‍යාපාර කළමණාකරන කමිටු රැස්වීම (පෙර කන්න රුස්වීම)**

**ගල්ඔය වම් ඉවුර ව්‍යාපරය - අම්පාර**

**2018 මාර්තු**

**01. රැස්වීම පැවැත් වු ස්ථානය - නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලීය රැස්විම් ශාලාව**

**02. රැස්වීම පැවැත්වු දිනය - 2018.03.27**

**03. රැස්විමේ ප්‍රධානත්වය - නේවාසික ව්‍යාපෘති කළමණාකරු- ගල්ඔය වම් ඉවුර**

**04. සහභාගීත්වය -**

**04.1 රජයේ නිළධාරින්**

| අ:අ: | නම | තනතුර | |
|---|---|---|---|
| 01 | ආර්.ඩි.ජේ.කේ.වනසිංහ මයා | ස: කෘ: අධ්‍යක්ෂ | අම්පාර |
| 02 | ඊ.ක්‍රිස්ට් දේශප්‍රිය මයා | නේවාසික ව්‍යාපෘති කළමණාකරු | නේවාසික ව්‍යාපෘති කළමණාකරන කාර්යාලය-අම්පාර |
| 03 | එම්.කරුණාරත්න මයා | අඩවි සහකාර | වනජිවි කාර්යාලය |
| 04 | සාලිය හපුගොඩ මයා | කෘෂි: උපදේශක | නාමල්තලාව |
| 05 | එස්.එම් විජෙසුරිය මයා | කෘෂි: උපදේශක | වාවින්න |
| 06 | ජේ.ඒ.ආර් යශෝධා මිය | කෘෂි: උපදේශක | පරගහකැලේ |
| 07 | ආර්.එම්.ඩී. රත්නායක මයා | දිස්ත්‍රික් අළෙවි විධායක | ලක් පොහොර |
| 08 | ඒ.ලියනගේ මයා | ප්‍රා:වාරිමාර්ග ඉංජිනේරු | අම්පාර |
| 09 | ඩබ්.එම්.ඒ.බී.විජේසුන්දර මයා | ඉංජිනේරු සහකාර | විරගොඩ |
| 10 | එන්.ටී.ආර්.ජයවීර මයා | ඉංජිනේරු සහකාර | උහන |
| 11 | ඩි.එස්.සේනාරත්න මයා | ඉංජිනේරු සහකාර | අම්පාර |
| 12 | කේ.එස්.ජී. සිරිසේන මයා | ගො:ප්‍රා: නිලධාරී | මායාදුන්න |
| 13 | ටි. සිවරාසා මයා | සංවර්ධන නිළධාරි | විරගොඩ |

| | | | |
|---|---|---|---|
| 14 | ජී.ඩී.ටී.සදරුවන් මයා | ඉංජිනේරු සහකාර | අන්නමලේ |
| 15 | ප්‍රමිලා ඇන්තනී මිය | සංවර්ධන නිළධාරි | ගොනාගොල්ල |
| 16 | එච්.ඩී. ලක්මාල් මයා | වි:හා:නි:(පැළැටි සංරක්ෂණ) | අම්පාර |
| 17 | කේ.ඩී.කේ.දිසානායක මයා | කෘෂිකර්ම උපදේශක | ගලපිටගල |
| 18 | එම්.එෆ්.ඒ.සනීර් මයා | නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ(ව්‍යාප්ති) | අම්පාර |
| 19 | ඒ.එම්.ප්‍රියන්ත බංඩාර මයා | සහකාර අධ්‍යක්ෂ | ජාතික පොහොර ලේකම් කාර්යාලය |
| 20 | ඒ.සී. සකියා මිය | සංවර්ධන නිළධාරි | නේවාසික ව්‍යාපෘති කළමණාකරන කාර්යාලය-අම්පාර |
| 21 | එම්.එන් සලීතා මිය | සංවර්ධන නිළධාරි | - එම - |
| 22 | එම්.එච්.එෆ්. නුෂා මිය | සංවර්ධන නිළධාරි | - එම - |
| 23 | අස්මියා බේගම් මිය | සංවර්ධන නිළධාරි | - එම - |
| 24 | වි.රම්මියා මිය | සංවර්ධන නිළධාරි | - එම - |
| 25 | එච්.එම් මධුෂා මිය | කළමනාකාරණ සහකාර | - එම - |
| 26 | කේ.එස්.කේ.හේරත් මිය | සංවර්ධන සහකාර | - එම - |
| 27 | ඒ.එම්. බසීර් මිය | සංවර්ධන නිළධාරි | - එම - |

## 04.2 ගොවි නියෝජිත මහතුන්

| අ:අ: | නම | ගොවි සංවිධානය | තනතුර |
|---|---|---|---|
| 01 | ඩී.කේ.එම්. ගුණසේකර මයා | එල්.බි. 15 | ගරු සභාපති |
| 02 | ඩබ්ලිව්.එම්.ගුණසේන මයා | එල්.බි.19 | ගරු සභාපති |
| 03 | ආර්.එම්.පොඩිඅප්පුහාමි මයා | එල්.බි.19 | ගරු ලේකම් |
| 04 | ආර්.එම්.ටිකිරිබංඩා මයා | යු.බි.01 | ගරු සභාපති |
| 05 | එච්.එම්.ඩිංගිරිබංඩා මයා | යු.බි.09 | ගරු ලේකම් |

| | | | |
|---|---|---|---|
| 06 | ඩී.එස්.එම් ඩබ්ලිව්.බංඩාර මයා | යූ.බි.09 | ගරු භාණ්ඩාගාරික |
| 07 | බී.ජී.ජයසිංහ මයා | යූ.බි.3,4,5,6 | ගරු භාණ්ඩාගාරික |
| 08 | බී.එම් විජේරත්න මයා | යූ.බි.02 | ගරු සභාපති |
| 09 | කේ.එම්.කුසුමා කමලසීලී මිය | එල්.බි.15 | ගරු ලේකම් |
| 10 | කේ.ඒ. ද සිල්වා මිය | එම්.9/11 | ගරු ලේකම් |
| 11 | ඒ. දයානන්ද මයා | යූ.බි.02 | ගරු ලේකම් |
| 12 | එච්.එච්.චන්ද්‍රසේන මයා | යූ.බි.02 | ගරු භාණ්ඩාගාරික |
| 13 | ආර්.පී.ජී.ජයසිංහ මයා | එල්.බි.8 | ගරු ලේකම් |
| 14 | කේ.එම්.එන්.ගුණසේකර මයා | එල්.බි.8 | ගරු සභාපති |
| 15 | රංජිත් විජේතුංග මයා | යූ.බි.7 | ගරු සභාපති |
| 16 | කේ.එල්.ඩී.ජයවික්‍රම මයා | එල්.බි.4 | ගරු භාණ්ඩාගාරික |
| 17 | ඩී.එම්.චන්ද්‍ර සේකර මයා | එල්.බි.5 | ගරු සභාපති |
| 18 | ඩී.එම්.ජයතිලක මයා | එල්.බි.5 | ගරු භාණ්ඩාගාරික |
| 19 | ගාමිනී සතරසිංහ මයා | යූ.බි.12 | ගරු ලේකම් |
| 20 | සී.එච්.කුමාර මයා | යූ.බි.12 | ගරු සභාපති |
| 21 | ඒ.සිරිසේන මයා | එම්. 01 | ගරු සභාපති |
| 22 | එන්.ආර්.විමලරත්න මයා | යූ.බි.10,11 | ගරු සභාපති |
| 23 | එල්.ජී. ප්‍රියන්ත මයා | එල්.බි.11 | ගරු භාණ්ඩාගාරික |
| 24 | එච්.ඒ. පියදාස මයා | එල්.බි.27ජී. 02 | ගරු ලේකම් |
| 25 | ඩබ්ලිව්.විරසිංහ මයා | ජී 03 | ගරු සභාපති |
| 26 | එස්.එච්.සෝමසිරි මයා | සේනාගම බි | ගරු ලේකම් |
| 27 | එම්.එම්.මුතුබංඩා මයා | එල්.බි.20 | ගරු සභාපති |
| 28 | ටී.එම්.කිරිබංඩා මයා | එල්.බි.20 | ගරු භාණ්ඩාගාරික |
| 29 | එච්.පී.රණවීර මයා | එම්17/20 | ගරු සභාපති |
| 30 | ඩබ්: ඩී සරත් කුමාර මයා | එම්17/20 | ගරු ලේකම් |
| 31 | කේ.ඒ.පුංචි නිලමේ මයා | එම්17/20 | ගරු භාණ්ඩාගාරික |
| 32 | ඒ.ඩබ්ලිව්.සරත් ගාමිනි මයා | එල්.බි.12 | ගරු ලේකම් |
| 33 | කේ.එම් සූරවීර මයා | එල්.බි.12 | ගරු භාණ්ඩාගාරික |
| 34 | ඒ.එම්.බංඩාර මයා | එල්.බි.34,35,36 | ගරු ලේකම් |
| 35 | ඩබ්ලිව්.එම්.විජේරත්න මයා | යූ.බි.16 | ගරු ලේකම් |
| 36 | ඩී.එම්.ධර්මසේන මයා | එල්.බි.11 | ගරු සභාපති |
| 37 | ඩී.එම්. පොඩිබංඩා මයා | එල්.බි.10 | ගරු සභාපති |

| | | | |
|---|---|---|---|
| 38 | එච්.එම්.මුතුබංඩා මයා | එල්.බී.10 | ගරු ලේකම් |
| 39 | සිරිපාල මාරසිංහ මයා | ජී 05 | උප සභාපති |
| 40 | කේ.ඩබ්ලිව් සීතා ජයලත් මිය | එල්.බී.07 පහළ | ගරු ලේකම් |
| 41 | ඒ.එම්.ගුණතිලක මයා | එල්.බී.10 | නියෝජිත |
| 42 | ඩබ්.ඒ.එස්.රත්නායක මයා | යූ.බී.16 | ගරු භාණ්ඩාගාරික |
| 43 | කේ.ජේ.එම්.සෝමතිලකමයා | එල්.බී 21/22 | ගරු ලේකම් |
| 44 | එල්.ආර්.චන්ද්‍ර සේකර මයා | එල්.බී.12 | ගරු භාණ්ඩාගාරික |
| 45 | ඩී.එම්.හීබංඩා මයා | එම්.9/11 | ගරු සභාපති |
| 46 | ජී.ඩී.මංජුල මයා | ජී 10 -බී | ගරු භාණ්ඩාගාරික |
| 47 | ආර්.එම්.ඥානවර්ධන මයා | ජී-10 බී | ගරු සභාපති |
| 48 | ධනපාල  කොඩිතුවක්කු මයා | ජී 13,14,16 | ගරු ලේකම් |
| 49 | ඩබ්ලිව්.ඒ ප්‍රසන්න කුමාර මයා | ජී 13,14,16 | ගරු සභාපති |
| 50 | ටී.එම්.ජයසුන්දර මයා | එල්.බී. 2,3 | ගරු ලේකම් |
| 51 | ඩී.එම්. වික්‍රමසිංහ මයා | එල්.බී.07 ඉහළ | ගරු ලේකම් |
| 52 | නිහාල් රොහණ මයා | යූ.බී.8,8ඒ | ගරු සභාපති |
| 53 | එස්.එම්.එස් ධර්මරත්න මයා | එල්.බී. 07 පහළ | ගරු සභාපති |
| 54 | එච්.එම්.ප්‍රේමරත්න මයා | එල්.බී.2, 3 | ගරු සභාපති |
| 55 | ඒ.එම්.අප්පුහාමි මයා | එල්.බී.2, 3 | ගරු භාණ්ඩාගාරික |
| 56 | ඩබ්ලිව්.එම්.සුදුබංඩා මයා | ජී. 05 | කෙත්ඇල නියොජිත |
| 57 | එන්.ජී.අමරරත්න මයා | එල්.බී.29,30,31,32 ජී.01 | ගරු සභාපති |
| 58 | වී.කේ.ගුණපාල මයා | ජී.4,7 | ගරු සභාපති |
| 59 | බී.ඒ.මුතුබංඩා මයා | ජී.10 | ගරු ලේකම් |
| 60 | එච්.ආර්.ඒකනායක මයා | එල්.බී.21,22 | ජල පාලක |
| 61 | ඒ.එම්.ජයසිංහ මයා | එම්.5,2 | ගරු භාණ්ඩාගාරික |
| 62 | කේ.ජේ.කේ.මැණිකේ මිය | එම්. 16/18 | ගරු භාණ්ඩාගාරික |
| 63 | එල්.ඒ.එම්.කුමාරිහාමි මයා | ජී. 03 | ගරු ලේකම් |
| 64 | එස්.ඒ.විපුලසේන මයා | එල්.බී.05 | ගරු ලේකම් |
| 65 | ආර්.එම්.සරත් මයා | එල්.බී. 6 | ගරු සභාපති |
| 66 | ඩබ්ලිව්.ජී.කරුණාදාස මයා | ජී.6 | ගරු භාණ්ඩාගාරික |
| 67 | ඊ.ජී.රම්බංඩා මයා | ජී, 10 බී. | ගරු ලේකම් |

| | | | |
|---|---|---|---|
| 68 | පී.ආර්.විජේරත්න මයා | එම්.10,12 | ගරු සභාපති |
| 69 | ඒ.සිරිසේන මයා | ජී,9/12 | ගරු සභාපති |
| 70 | ආර්.පී.සෝමපාල මයා | එම්. 16,18 | ගරු ලේකම් |
| 71 | ආර්.පී.විමලදාස මයා | ජී. 10 | ගරු සභාපති |
| 72 | එස්.පී.ගුණරත්න මයා | යූ.බී.17 | ගරු ලේකම් |
| 73 | ඩී.එම්. ඒ. දිසානායක මයා | එල්.බී.1 | ගරු ලේකම් |
| 74 | පී.එස්.ගුණරත්න මයා | එල්.බී.5 | ගොවිමහතා |
| 75 | ආර්.පී තිලකරත්න මයා | එල්.බී.6 | ගරු භාණ්ඩාගාරික |
| 76 | එම්.ඒ අබ්දුල් අසීස් මයා | කොණ්ඩවටුවාන | ගරු ලේකම් |
| 77 | කේ.එම්.එම්. ස්මයිල් මයා | කොණ්ඩවටුවාන | ගරු සභාපති |
| 78 | ජී.ආර්.උපාලි බංඩාර මයා | එල්.බී. 07 පහළ | ගරු භාණ්ඩාගාරික |
| 79 | ඩබ්ලිව්.ජී.ඩී.සිරිපාල මයා | එල්.බී. 21,22 | ගරු භාණ්ඩාගාරික |
| 80 | ඩී.එම්. නාලක රුවන් මයා | සේනාගම | ගරු සභාපති |
| 81 | කේ.පී.ආරියපාල මයා | රුහුණුගම | ගරු භාණ්ඩාගාරික |
| 82 | ඩී.එම්.දසානායක මයා | එල්.බී. 4 | නියෝජිත |
| 83 | එච්.එම්.සෝමලතා මිය | ජී. 06 | ගරු ලේකම් |
| 84 | ඒ.එම්.ආරියදාස මයා | එම්.5 ඒ | ගරු භාණ්ඩාගාරික |
| 85 | ජී.බී. සෝමරත්න මයා | එල්.බී.01 | ගරු භාණ්ඩාගාරික |
| 86 | ඩබ්.ඩබ්.ඒ.ගුණසේන මයා | එම්. එස්.5 | ගරු ලේකම් |
| 87 | එන්.ජී. කරුණාවන්ත මයා | කුමුදුගම | ගරු සභාපති |
| 88 | ලිලන්ත ගම්ලත් මයා | යාය 04 | ගරු ලේකම් |
| 89 | පී.ගාල්ලගේ මයා | යාය 04 | ගරු සභාපති |
| 90 | එම්.එන් ධනපාල මයා | එල්.බී.23,24,25 | ගරු ලේකම් |
| 91 | කේ.වී.ජී. සුමිත් ධර්මප්‍රිය මයා | එල්.බී.23,24,25 | ගරු සභාපති |
| 92 | පි.බී.හේරත් මයා | යූ.බී.01 | ගරු ලේකම් |
| 93 | ඒ.ඒ. ගුණදාස මයා | යූ.බී. 10,11 | ගරු ලේකම් |
| 94 | වයි.පී. ගුණසේකර මයා | එම් 08 | ගරු සභාපති |
| 95 | පී.එම්. ප්‍රියන්ත මයා | ජී 9,12 | ගරු භාණ්ඩාගාරික |
| 96 | සී.එච්.සරත් කුමාර මයා | ජී.11,15 | ගරු භාණ්ඩාගාරික |
| 97 | නිමල් සිරි විජේසූරිය මයා | රුහුණුගම | ගරු සභාපති |
| 98 | එල්.පී.එල්.සිසිර කුමාර මයා | එල්.බී.04 | ගරු සභාපති |
| 99 | ඩී.ඒ. සමරනායක මයා | යූ.බී.07 | නියෝජිත |

| | | | |
|---|---|---|---|
| 100 | කේ.සී.එස්. විජේරත්න මයා | රුහුණුගම | නියෝජිත |
| 101 | ඩබ්ලිව්.ඒ.බන්දුල මයා | එල්.බි.14 | ගරු භාණ්ඩාගාරික |
| 102 | ජී.ජී.ජයසේන මයා | එල්.බි.12 | ගරු සභාපති |
| 103 | ආර්.එම්.එම්.රාජපක්ෂ මයා | එල්.බි.14 | ගරු ලේකම් |
| 104 | ආර්.කේ.බී.එම්.ජයතිලක මයා | එල්.බි.14 | ගරු සභාපති |
| 105 | ආර් කරුණාරත්න මයා | යූ.බි.09 | ගරු සභාපති |
| 106 | ඩී.එම්.දසනායක මයා | යාය 04 | නියෝජිත |
| 107 | ඩී.එම්.දිසානායක මයා | යාය 04 | නියෝජිත |
| 108 | එච්.එම්.දයාරත්න මයා | | ඇල නියෝජිත |
| 109 | ආර්.එම් ධනපාල මයා | සේනාගම | නියෝජිත |
| 110 | ආර්.එච්.උක්කුබංඩා මයා | රජගලතැන්න | ගොවි නියොජිත |
| 111 | ධනවංශ බංඩාර මයා | උහන | ගොවි නියෝජිත |

ආගම සිහි කිරිමෙන් අනතුරුව ගල්ඔය වම් ඉවුර නේවාසික ව්‍යාපෘති කළමණාකරු ඊ.ක්‍රිස්ටි දේශප්‍රිය මහතා විසින් පැමිණ සිටි රජයේ නිළධාරින් හා ගොවි නියෝජිත මහත්ම/මහත්මීන් සාදරයෙන් පිළිගැනීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදි.

**05.ආයතන සංවර්ධන කටයුතු - නේවාසික ව්‍යාපෘති කළමණාකරු**

**මහ සභා රැස්වීම් පැවැත්වීම**

මෙවර ජලය ලබා දිම සිදු කරන ගොවි සංවිධානවල මහ සභා රුස්විම් කඩිනමින් පවත්වා අවසන් කළ යුතු බවත්, ඒ සඳහා ගොවි සංවිධාන උනන්දු වන ලෙසත් දන්වා සිටින ලදි.

**විගනන කටයුතු**

පසුගිය අවුරුද්දේ ගොවි සංවිධාන 58 ක ගිණුම් විගණන කටයුතු අවසන් කර ඇති බවත්, ගිණුම් විගණනය නොකළ ගොවි සංවිධාන පහත පරිදි වන බවත් ප්‍රකාශ කළා.

- එල්.බි. 12 බෙදුම් ඇල ගොවි සංවිධානය
- කොණ්ඩවටුවාන බෙදුම් ඇල ගොවි සංවිධානය

➢ එම් 17/20 බෙදුම් ඇල ගොවි සංවිධානය ආදි වශයෙන් වේ.

## 2018 යල කන්නය සඳහා පෙර කන්න තීරණ ගැනීම

**වාරිමාර්ග කටයුතු - ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු - අම්පාර**

2018.03. 27 වන දිනට වැවේ ජල ධාරිතාවය - අක්කර අඩි 137440 කි
අඩි 59.6 ක් බව ප්‍රකාශ කළා.

පානිය ජල අවශ්‍යතා හා අනෙතුත් ජල අවශ්‍යතා සඳහා ජලය ඉතිරි කර ගැනීමෙන් අනතුරුව වගාව සඳහා ලබා දිය හැකි ජල ප්‍රමාණය පහත සඳහන් පරිදි වන බව ප්‍රකාශ කරන ලදි.

ගල්ඔය වම් ඉවුර සඳහා අක්කර 7500
ගල්ඔය දකුණු ඉවුර සඳහා අක්කර 6700 ක්ද
ගඟ ආශ්‍රිතව අක්කර 5800 ක් ද වශයෙන් අක්කර 20000 ක් වගා කිරීමට ජලය ලබා දිය හැකි බවත්, ගල් ඔය ගඟට පහත් වන කාන්දු ජලය, ආඳල්ඔයට පහත් වන කාන්දු ජලය වැනි ජලය උපයෝගී කර ගෙන මෙම ප්‍රමාණය අක්කර 26624 ක් දක්වා වැඩි කිරීමට තීරණය කල බවත්, ඒ අනුව ගල්ඔය වම් ඉවුර යටතේ වගා කරනු ලබන අක්කර ප්‍රමාණය පහත සඳහන් පරිදි වන බවත් ප්‍රකාශ කරන ලදි.

අම්පාර ඒකකය අක්කර 2757
උහන ඒකකය අක්කර 3435
ගොනාගොල්ල ඒකකය අක්කර 2500

ඒ අනුව අප්‍රේල් 15 දින කන්නය ආරම්භ කිරීමට යෝජනා කරන බවත්, අප්‍රේල් 30 වන විට බිම් සකස් කර වපුරා අවසන් කල යුතු බවත්, එතැන් සිට දින 05 න් 05 ට මුර ක්‍රමයට වගාවට ජලය ලබා දෙන බවත්, ජුලි 30 කන්නය අවසාන කිරීමට යෝජනා කරන බවත් පැවසීය.

**ඉංජිනේරු සහකාර - උහන/අන්නමලේ**

වැවේ පවතින ජල ධාරිතාවයෙන් විවිධ අවශ්‍යතාවයන් සඳහා ඉතිරි කර ගන්නා වතුර ප්‍රමාණය තබා ගත් පසු වගාවන් සඳහා ලබා දිය හැකි වතුර ප්‍රමාණය අක්කර අඩි 70000 ක් පමන වන බවත්, මෙයින් අක්කර 26000 ක් පමණ වගා කළ හැකි බවත් ප්‍රකාශ කර සිටින ලදි. ඒ අනුව

අම්පාර ඒකකයේ සම්පූර්ණ බිම් ප්‍රමාණයත්, උහන ඒකකයේ යු.බි.07 ඇල දක්වාත් ගොනාගොල්ල ඒකකයේ දොර 5 න් ඉහළ කොටසටත් ජලය ලබා දිම සිදු කරන බව පැවසීය. ඉදිරියේදි තවත් ජලය අක්කර අඩි 27000 ක් පමන වර්ෂාවෙන් වැවට එකතුවේය යන බලාපොරොත්තුවෙන් මෙම අක්කර 26000 වගා කිරිමට යෝජිත බවත් මෙම වපසරිය වගා කිරිම සඳහා ගොවි මහතුන්ගේ පුර්ණ සහයෝගය අවශ්‍ය බවත් පැවසීය.

ජල මුර ක්‍රමය ආරම්භ කළ පසු දින පහෙන් පහට ජලය ලබා දිම කරන බැවින්, මෙම දින 5 ඇතුලත තම කුඹුරට ජලය ලබා ගත හැකි නම් පමණක් දැනට වගා කිරීමට අනුමත කුඹුරුද වගා කළ යුතු බව පැවසීය. දින 5 න් පසු අනිවාර්යයයෙන්ම ඇල වසන බවත්, මෙම දින 5 ට වම් ඉවුරට පමණක් අක්කර අඩි 2400 ක පමණ ජල ප්‍රමාණයක් වැවෙන් ලබා ගත යුතු බව තව දුරටත් පැවසීය.

**ගරු සභාපති - ජී 10 බෙදුම් ඇල ගොවි සංවිධානය**

ජලාශයට වර්ෂාවෙන් තවත් ජලය ලැබුනහොත් දැනට වගා නොකරන කොටස් වලටත් වගාව සඳහා ජලය ලබා දෙනවාදැයි විමසීය.

**නේවාසික ව්‍යාපෘති කළමණාකාරු**

වැස්සොත් දෙවන අදියරේදි ඉතිරි කොටස් වලටද ජලය ලබා දිම සිදු කරන බව පැවසීය.

**ගරු සභාපති - එම් 01 බෙදුම් ඇල ගොවි සංවිධානය**

මැයි 15 දක්වා වර්ෂාව ලැබේ දැයි බලා, සියළු දෙනාටම එකවර ජලය නිකුත් කිරිම කරන ලෙස ඉල්ලු අතර, මෙවර වගා නොකරන ගොවින් වෙනුවෙන් ගන්නා ක්‍රියාමාර්ගය කුමක්දැයි විමසීය.

**නේවාසික ව්‍යාපෘති කළමණාකාරු**

කන්නය ප්‍රමාද කිරිම කිසිසේත් කල නොහැකි බවත්, පසුගිය දිනවල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පැවති රැස්වීම් වලදිද කන්නය පමා කිරිම සුදුසු නොවන බව දේශපාලන

අධිකාරියේද මතය වු බව පැවසීය. ඒ අනුව කඩිනමින් වගාව සඳහා යොමු විය යුතු බව දැන්වීය.

**ගරු සභාපති - ජී 10 බෙදුම් ඇල ගොවි සංවිධානය**

අප්‍රේල් මාසය තුළ ඇතිවන සංවහන වැසි රටාව සලකා බලා ජී 05, ජී 4/7 ඇවල්වල කෙළවර දක්වා ජලය ලබා දෙන ලෙස ඉල්ලීය. වි ගොවිතැනින් යැපෙන ගොවීන්ගේ ප්‍රධාන ජීවනෝපාය මග හැරුනොත් එම ගොවින් ජීවත් කරවීමට සහන අවශය බව පැවසීය.

**ඉංජිනේරු සහකාර - උහන/අන්නමලේ**

ඉදිරියේදී සංවහන වැසි වලින් තවත් අක්කර අඩි 27000 ක් ජලාශයට එකතු වේ යයි බලාපොරොත්තුවෙන් අක්කර 26000 ක් වගා කිරීමට තීරණය කලත්, දැනට ජලාශයේ ඇති ජල ප්‍රමාණයෙන් සත්‍ය වශයෙන් ම වගා කලහැක්කේ අක්කර 15000 ක් පමණක් බව පැවසීය.

**ගරු සභාපති - යු.බි. 12 බෙදුම් ඇල ගොවි සංවිධානය**

වර්ෂාව බලාපොරොත්තුවෙන් කරන කටයුතු පිළිබදව විශ්වාසයක් තැබිය නොහැකි බව පැවසීය. නොවැම්බර්, දෙසැම්බර් වර්ෂාව බලාපොරොත්තු වූ නමුත්, එම වර්ෂාව නොලැබීම මත අප්‍රේල් සංවහන වැසි බලාපොරොත්තුවෙන් වී වගාව පිහිටුවීම අනාරක්ෂිත බව පැවසීය.

දේශපාලඥයෝ ගන්නා තිරණ පිළිබද සැලකිල්ලට නොගත යුතු බවත්, පසුගිය කාලයේ දේශපාලඥයෝ රසායනික පොහොර නියමිත වෙලාවට ලබා දීම ගැන කතා නොකළ නමුත්, වැවේ තිබෙන වතුර ප්‍රමාණය, වතුර ලබා දෙන දින වකවානු පිළිබදව කතා කරන බව පැවසීය. දේශපාලඥයන් කතා කළ යුත්තේ වතුර දෙන දිනය නොව වතුර නැතිව අසරණ වන ගොවි මහතුන් පිළිබදව හා ඔවුන්ට දෙන සහන පිළිබඳ ව බව පැවසීය.

වි වගා කළ නොහැකි ප්‍රදේශවල අතිරේක බෝග වගා කිරිමට ගොවීන් තිරණය කර ඇති බවත්, ඒ සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සුදානම්දැයි පැහැදිලිව ප්‍රකාශ කරන ලෙස ඉල්ලීය.

මේ වන විට අලි ප්‍රශ්ණයෙන් ගොවි මහතුන් විශාල ලෙස අසරණ වි ඇති බවත් දේශපාලඥයින් ඒවා පිළිබඳව සොයා බැලිය යුතු බවත් පැවසීය.

**ගරු භාණ්ඩාගාරික - යු.බි 16 බෙදුම් ඇල ගොවි සංවිධානය**

වැවේ තිබෙන වතුර ප්‍රමාණය අනුව වාරිමාර්ග දෙපාර්තමේන්තුව අරගෙන තිබෙන තීන්දු තිරණ නිවරදි බවත්, වගා කිරිමට නොහැකි වන ගොවි මහතුන් වෙනුවෙන් ලබා දෙන සහන පිළිබඳව දැන්ම සාකච්ජා කරමුයි ඉල්ලීය.

සැප්තැම්බර් මාසය සිට වගා නෙකරන ගොවි මහතුන් සඳහා සහනාධාරයක් ලබා දිමට කටයුතු කරන ලෙසද ඉල්ලීය.

**නේවාසික ව්‍යාපෘති කළමණාකරු**

සිංහල අලුත් අවුරුද්දට කලින් සියලුම ගොවි මහතුන් මුලික බිම් සකස් කිරීම කරන ලෙස ඉල්ලීය.

**ඉංජිනේරු සහකාර - උහන/අන්නමලේ**

පසුගිය කන්නයේ අප්‍රෙල් 05 වන දින සිට වතුර ලබා දි දවස් 10 ක් 15 ක් වතුර අපතේ ගිය බවත්, ඒ නිසා සිංහල අලුත් අවුරුද්දෙන් පසු වතුර ලබා දිමට කටයුතු කරන බවත් පැවසීය.

**06.කෘෂිකාර්මික කටයුතු**

**නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ(ව්‍යාප්ති) - එම්.එෆ්.ඒ.සනීර් මහතා**

අක්කර 120000 ක් පමණ සේනානායක සමුද්‍රය යටතේ වගා කරන නමුත්, මෙවර කන්නයේ පවතින ජල හිඟය හේතුවෙන් අක්කර 26000 ක් පමණ වගා කිරිමට තිරණය කළ බව පැවසීය. මහා වාරිමාර්ග ව්‍යාපාර වල අතිරේක භෝග වගා කිරිම පිළිබඳ කතා

කළ නොහැකි බවත්, වර්ෂා ජලයෙන් වගා කළ හැකි නම් අතිරේක භෝග වගා කරන ලෙසත්, බීජ අවශ්‍ය නම් සැපයීම කළ හැකි බවද පැවසීය.

හිතුමතේ කරන වගාවන් වලදී කෘෂි උවදුරු ඒමට ඉඩ තිබෙන බැවින් හිතුමතේ වගාවන් වලට යාම සිදු නොකරන ලෙස දැන්වීය.

අප්‍රේල් 15 දින යල කන්නය ආරම්භ කිරීමට වාරිමාර්ග දෙපාර්තමේන්තුව කල යෝජනාව සුදුසු බව පැවසීය.

**ගරු භාණ්ඩාගාරික - යූ.බී 16 බෙදුම් ඇල ගොවි සංවිධානය**

අයාලේ යන ගවයින්, වන අලි වැනි ගැටළු නිසා අතිරේක භෝග වගාවකට යාමටද අපට හැකියාවක් නොමැති බැවින් පොහොර සහනාධාරය සඳහා වියදම් කරන මුදල වගා නොකරන ගොවීන්ට සහනාධාරයක් වශයෙන් දිමට යොදා ගන්නා ලෙස ඉල්ලීය.

**ගරු සභාපති - යූ.බී. 09 බෙදුම් ඇල ගොවි සංවිධානය**

කැකුලමට මුලික බිම් සකස් කිරීම කළහොත් වතුර නොලැබෙන ගොවි මහතුන්ට එහිදී ඉතිරි වන වතුර ලබා දිය හැකිදැයි විමසීය.

**නේවාසික ව්‍යාපෘති කළමණාකරු**

ජලය ලබා නොදෙන කොටස්වල ජනතාවගේ පරිභෝජනය සඳහා ඇලවල් වල යවන කුඩා ජල ප්‍රමාණය භාවිතා කර ඇල මුල සිටින ගොවීන් වී වගා කිරීමට පෙළඹුණහොත් ඉදිරියේදී විශාල ගැටළුවකට මුහුන දීමට සිදුවිය හැකි බව ප්‍රකාශ කළේය.

**සහකාර අධ්‍යක්ෂ - ජාතික පොහොර ලේකම් කාර්යාලය**

රුපියල් 500/- මිළකට 50 Kg පොහොර මිටියක් ලබා දිමට රජය කටයුතු කර ඇති බවත් කන්නයට අවශ්‍ය පෙහොර තොග පවතින බවත් පැවසීය.

**ගරු සභාපති - එල්.බී. 37,38,39 බෙදුම් ඇල ගොවි සංවිධානය**

නුගේලන්ද, රජගලතැන්න කොටස් වලට නවගිරියාව වැවෙන් වතුර දෙන නිසා අක්කර 5500 ක් වගා කරන බවත් රසායනික පොහොර අප්‍රේල් 10 වන දිනට පෙර අවශ්‍ය බවත් පැවසීය

**අලෙවි විධායක - ලංකා පෙහොර සමාගම**

2015 සහනාධාර පෙහොර ලබා දුන් ආකාරයටම අප්‍රේල් 10 වන දින වන විට පොහොර ලබා දිය හැකි බවත්, ලක් පොහොර සමාගමේ පොහොර ගොවිජන සේවා මධ්‍යස්ථාන වලට ලබා දෙන බව පැවසීය.

අම්පාර දිස්ත්‍රික්කයට අවශ්‍ය පොහොර දැනට ගබඩාවේ ඇති බවත්, රුපියල් 350/- පොහොර මිටිය රක්ෂණය සමග රුපියල් 500/- ට ලබා දෙන බවත්, අමතර පොහොර අවශ්‍ය නම් රුපියල් 1500/- මිළට පෞද්ගලික අංශයෙන් ලබා ගත හැකි බව පැවසීය.

ඒ අනුව අප්‍රේල් 15 දින 2018 යල කන්නය ආරම්භ කිරීම සුදුසු බවට කල යෝජනාවට එකඟ බව පැවසීය.

**ගරු සභාපති - එල්.බි.21/22 බෙදුම් ඇල ගොවි සංවිධානය**

එල්.බි.21/22 ඇලට වතුර දෙනවාදැයි විමසීය.

**ඉංජිනේරු සහකාර - උහන/අන්නමලේ**

වෙලේ කඩේ ලගට වතුර දෙන බව පැවසීය. මුර ක්‍රමය ක්‍රියාත්මක වන දින 5 ක් තුළදී වතුර ඉන් එහාට ගෙන යා නොහැකි බව පැවසීය.

**ගරු භාණ්ඩාගාරික - යු.බි. 16 බෙදුම් ඇල ගොවි සංවිධානය**

යු.බි. 16 බෙදුම් ඇල ගොවි සංවිධාන බල ප්‍රදේශය මෙවර වගා නොකරන බැවින් මෙම කන්නයේ යු.බි. 16 බෙදුම් ඇලේ වැව හැරිය හැකිදැයි විමසීය.

**ඉංජිනේරු සහකාර උහන/අන්නමලේ**

සෑම ගොවි සංවිධානයකම පවතින කුඩා වැව් භාරා ගත හැකි නම් මෙම ජල හිගය බොහෝ දුරට විසදෙන බව පැවසීය.මේ සඳහා මුදල් ලැබෙන්නේ නම් ලැබෙන ඉක්මනින් කළ හැකි බවත් මේ සඳහා පොදු වැඩ පිළිවෙළක් සකස් කර ගන්නා ලෙසත් ඉල්ලීය.

**ගරු සභාපති - ජී. 03 බෙදුම් ඇල ගොවි සංවිධානය**

ගොනාගොල්ල ජී.03 ඇලේ ගෙවල් 64 ක් පවතින බවත්, ඇලේ වතුර එන්නේ නැති නිසා ළිංවල පවා වතුර සිඳී ඇති බවත් මිනිසුන්ට බොන්නවත් වතුර නැති බව පැවසීය.

**ගරු ලේකම් - ජී 03 බෙදුම් ඇල ගොවි සංවිධානය**

**සෑම වැව් රක්ෂිතයකම මිනිසුන් පදිංචිව සිටින බවත් ඔවුන් සියලු දෙනාම ඒවායෙන් ඉවත් කරන ලෙසත් ඉල්ලීය.**

**ගරු සභාපති - ජී 06 බෙදුම් ඇල ගොවි සංවිධානය**

හරක් ප්‍රශ්ණය ප්‍රබල ගැටලුවක් බවත් මේ සම්බන්ධයෙන් දැඩි පියවරක් ගත යුතු බවත් පැවසීය.

**ඉංජිනේරු සහකාර - උභන අන්නමලේ**

වැව් රක්ෂිත අල්ලා ගෙන සිටින අය ඉවත් කළ යුතු බවට ගොවි සංවිධාන විසින් ඉල්ලීමක් කරන ලෙසත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව විධියට මේවාට මැදිහත් වන විට තැන් තැන්වල හිරවන බවත්, ඒ සඳහා කාලයක් ගත වන බවත්, එය කඩිනම් කිරිම සඳහා ගොවි සංවිධාන ඉදිරිපත් වන ලෙසත් ඉල්ලීය.

**ගරු භාණ්ඩාගාරික - යු.බි. 09 බෙදුම් ඇල ගොවි සංවිධානය**

ඇලවල් ශුද්ධ කිරිම හා සංවර්ධන මුදල් එකතු කිරීම පිළිබදව විමසන ලදි. ඇලේ රක්ෂිත කණු ටික දමා දෙන ලෙසද ඉල්ලීය.

**නේවාසික ව්‍යාපෘති කළමණාකරු**

වතුර දුන්නත් නැතත් ඇලවල් ටික ශුද්ධ කරන ලෙසත් මෙම කන්නයේ සිට සංවර්ධන මුදල රුපියල් 150/- ක් වන බවත්, වතුර ලැබී වගා කරන ගොවි සංවිධානවල සංවර්ධන මුදල් අය කරන ලෙසත් දැන්වීය.

**ගරු සභාපති - එල්.බි.07 පහළ බෙදුම් ඇල ගොවි සංවිධානය**

13/1 ඇල ගොඩ දැමීම කළයුතු බව පැවසීය.එල්.බි.7/1 ඇල දින 5 ක් යන්නට කලින් වසන බව පැවසීය.

ප්‍රධාන ඇලේ ගල්වැටියක් දමා තිබු බවත්, මෙය ඉවත් කර ඇති බවත්, ඉවත් කිරිම නිසා වතුර එන වේගය අඩු වි ඇති බවත් මෙම ගල් වැටිය නැවත දමා දෙන ලෙසත් ඉල්ලීය.

**ඉංජිනේරු සහකාර - උහන/අන්නමලේ**

එල්.බි. 03 ඇලට අද දින මැෂිමක් දෙන බවත්, 3 ඇලේ එම කාර්ය අවසන් වීමෙන් පසු 7 ඇල ශුද්ධ කර ගනිමුයි යෝජනා කල අතර ගල්වැටියේ ප්‍රශ්නය පිළිබඳවද සොයා බැලිය යුතු බවත්, ඉන් අනතුරුව එයට විසඳුමක් ගත හැකි බවත් පැවසීය.

**ගරු සභාපති - යු.බි. 9 බෙදුම් ඇල ගොවි සංවිධානය**

මේ වන විට අලින්ගේ වාසස්ථාන වී ඇති කෝමාරිය ආදල්ඔය ආදියෙහි ලඳු කැලෑ ටික ඉවත් කර දෙන ලෙස ඉල්ලීය.

**ඉංජිනෙරු සහකාර- උහන/අන්නමලේ**

හැකි වේලාවට මැෂිමක් ලබා දෙන බව පැවසීය.

**ගරු සභාපති - එල්.බි.21/22 බෙදුම් ඇල ගොවි සංවිධානය**

ප්‍රධාන ඇල රොන් මඩ වලින් පිරි ඇති බවත් ගොඩ දමා දෙන ලෙසත් ඉල්ලීය.

**ඉංජිනේරු සහකාර - උහන/අන්නමලේ**

මේ වන විට නඩත්තු වැඩ ඉටු කරන බවත්, මැෂින් නිදහස් විමෙන් පසු ලබා දීමට කටයුතු කරන බවත් පැවසීය.

**ගරු සභාපති - සේනාගම බෙදුම් ඇල ගොවි සංවිධානය**

වලගම වැව් රක්ෂිතයේ වගා කටයුතු සිදු කරන මිනිසුන් වලගම වැවේ සොරොව්වේ කොට හිරකර වැවේ ජලය පිරීමට ඉඩ නොදෙන බවත්, ඒ නිසා වැව් රක්ෂිතය මැන වෙන් කර දෙන ලෙසත් ඉල්ලීය.

එසේම ආදල්ඔයේ වැලි ගොඩ දැමීම නිසා සේනාගම මට්ටයාගේ අමුණ කිදා බසින බවත් මෙම වැලි ගොඩ දැමීම සම්බන්ධයෙන් තිරණයක් ගන්නා ලෙසත් ඉල්ලීය.

**ඉංජිනේරු සහකාර - අන්නමලේ**

එහි වැලි බලපත්‍රය මේ මාර්තු මාසයේ අවසන් විමට තිබූ නමුත්, එය නැවත තවත් මාස 06 කින් දික්කර ඇති බවත්, වැලි ද යම් ප්‍රමාණයකින් ජනතාවට අවශ්‍ය වන නමුත් එය පරිසරයට හානියක් නොවන ආකාරයෙන් ලබා ගත යුතු බවත්, මෙහි තත්වය පරික්ෂා කර බලා තීරණයක් ගන්නා බව පැවසීය.

**ගරු සභාපති - එල්.බී 20 බෙදුම් ඇල ගොවි සංවිධානය**

එල්.බී 20 දිය බෙදුම් හංදියේ විශාල වල් කුට්ටියක් හිර වී ඇති බවත්, එය ඉවත් කිරිමට ස්කැවේටර් යන්ත්‍රයක් ලබා දෙන ලෙසත් ඉල්ලීය.

**වනජීවි කටයුතු**

**ගරු සභාපති - එල්.බී. 19 බෙදුම් ඇල ගොවි සංවිධානය**

ආදල්ඔය කැලෑ කුට්ටියේ වන අලි 06 දෙනෙක් පමණ ඉන්නා බවත්, මොවුන් රාත්‍රී කාලයට වගා විනාශ කරන බවත් පැවසීය.

**වනජීවි දෙපාර්තමේන්තුව**

එම අලින් අලි වෙඩි යොදා පන්නා දැමීමට යෝජනා කර ඇති බවත්, ප්‍රදේශයේ පොඩි පොඩි ලදු කැලෑ ඉවත් කිරිමට කටයුතු කරන බවත්, අලි වෙඩි සුලු ප්‍රමාණයක් ලබා දිම කළ හැකි බවත්, මේ සඳහා ග්‍රාම නිළධාරි මහතාගේ නිර්දේශය සහිත ලිපියත් ඉදිරිපත් කරන ලෙසත් ඉල්ලීය.

## 2018 යල කන්නය සඳහා වූ පෙර කන්න රැස්වීමේ ගත් තීරණ

## ගල්ඔය වම් ඉවුර ව්‍යාපාරය

| අ:අ: | විස්තරය | |
|---|---|---|
| 01. | කෙත් ඇලවල් හා බෙදුම් ඇලවල් ගොවීන්/ වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින්, නඩත්තු වැඩ අවසන් කිරීමට යෝජිත දිනය | 2018.04.07 |
| 02. | පසුගිය වගා රටාව පදනම් කර ගෙන වගා කිරීමට නියමිත බිම් ප්‍රමාණය | අක්කර 10400 * |
| 03. | කන්නය ආරම්භ කිරීමට යෝජිත දිනය<br>අවසන් කිරීමට යෝජිත දිනය | 2018.04.15<br>2018.07.30 |

| | | |
|---|---|---|
| 04. | කන්නය සඳහා සුදුසු බෝග වර්ගය හා බෝග රටාව | වී මාස 3, 3½ |
| 05. | බිම් සකස් කර වපුරා අවසන් කිරීමට යෝජිත දිනය | 2018.04.30 |
| 06. | ගවයන් හා ට්‍රැක්ටර් ක්ෂේත්‍රයෙන් ඉවත් කිරීමට යෝජිත අවසන් දිනය | 2018.04.30 |
| 07. | වගාවන් රක්ෂණය කල යුතු අවසන් දිනය | 2018.04.30 |
| 08. | ඇල වේලි වලට හානි කරන්නන්ගෙන් අයවිය යුතු දඩ මුදල | වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ තක්සේරුව අනුව |
| 09. | ඇල වේලි සුද්ද නොකරන්නන්ගෙන් අයවිය යුතු දඩ මුදල | මීටර් 01කට රු: 100/- |
| 10. | ගොවි සංවිධාන විසින් ඇලවල් වල මෙහෙයුම් නඩත්තු වැඩ සඳහා ගොවීන්ගෙන් අයකිරීමටයෝජිත මුදල | අක්කර 01කට රු: 150/- |
| 11. | අයාලේ යන ගවයන් ඇල්ලීමේ ගාස්තුව(කනුපල ගාස්තුව) | එක් ගවයකුට රු: 500/- |

* අම්පාර වාරිමාර්ග ඒකකය - අක්: 2757 (මුළු බිම් ප්‍රමාණයම වගා කෙරේ)
උහන වාරිමාර්ග ඒකකය - අක්: 3435
(හිමිදුරාව 10 ඇලේ සිට පාලම් කඳවුර යූ.බී. 07 ඇල දක්වා වන කොටස හා එල් බී 16 ඇල දක්වා වන කොටස)
ගොනාගොල්ල වාරිමාර්ග ඒකකය - අක්: 2500
( එල් බී. 19 ඇලේ සිට දොර 05 නැමති ජල පාලන නිර්මිතය දක්වා)
වීරගොඩ හා අන්නමලේ වාරිමාර්ග ඒකක වලට ජලය ලබා නොදේ)
මීට අමතරව පහත් ජලය උපයෝගී කර ගෙන
මුංගිල් ආරු අක්කර 958, කිරිපට්ටටි යාය අක්කර 100, සේනාගම
අමුණ යටතේ අක්කර 450, ආච්චඩියාය අක්කර 200 ක් හා ජලය නිකුත් කල පසු (දැනට නිශ්චිච සඳහන් කල නොහැකි),දිය බස්නා ඇලවල්වලින් ජලය පොම්ප කර/ අමුණු බැඳ,වගා ලිං උපයෝගී කර ගෙන කුඹුරු වල නීත්‍යාණුකූලව වී වගා කිරීමටද නිර්දේශ කෙරේ)

2018 යල කන්නය වෙනුවෙන් ගන්නා ලද පෙර කන්න යෝජනා සුදුසු බවට එල්.බී. 10 බෙදුම් ඇල ගොවි සංවිධානයේ ගරු ලේකම්තුමා යෝජනා කළ අතර, එම යෝජනා සුදුසු බවට එල්.බී. 20 බෙදුම් ඇල ගොවි සංවිධානයේ ගරු සභාපතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**ස්තුති කථාව - නේවාසික ව්‍යාපෘති කළමණාකාරු - ගල්ඔය වම් ඉවුර ව්‍යාපාරය**

අද දින පැවති 2018 යල කන්නය සඳහා වූ පෙර කන්න රැස්වීම සාර්ථක කර ගැනීමට පැමිණි රජයේ නිළධාරින්ටත් ගොවි නියෝජිත මහත්ම/මහත්මීන්ටත් ස්තුතිය පුද කළ අතර, 2018 යල කන්නය සාර්ථක කර ගැනීමට සියලු දෙනාගේ සහයෝගය ලබා දෙන ලෙසත්, ඉල්ලා සිටිමින් රැස්වීමේ කටයුතු ප.ව. 1.00 ට පමණ අවසන් කරන ලදි.

සකස් කලේ:-
කේ.එස්.කේ. හේරත්
සංවර්ධන සහකාර
වාරිමාර්ග කලමනාකරණ අංශය

ඊ. ක්‍රිස්ටි දේශප්‍රිය
නේවාසික ව්‍යාපෘති කලමනාකරු
ගල්ඔය වම් ඉවුර ව්‍යාපාරය
අම්පාර.